00039

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය ඩිප්ලෝමා වැඩ සටහන - **4** වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**EPD4530/ESD2230 -** ළමා සංවර්ධනය **II**

කාලය – පැය තුනයි. (03)

| දිනය - 2023.06.25 | වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා |
|---|---|

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## <u>1 වන කොටස</u>

01. අපගේ ස්නායු පද්ධතියේ ඇති නියුරෝන වර්ග තුන (03) නම් කර ඉන් එක් නියුරෝන වර්ගයක ක්‍රියාකාරීත්වය විස්තර කරන්න.

02. ප්‍රජානනය කෙරෙහි දායකවන චින්තන ක්‍රියාවලීන් තුනක් (03) පැහැදිලි කරන්න.

03. තුමුල - පහ (**Big – five**) පෞරුෂ ආකෘතිය මගින් ඉදිරිපත් කරන ලද පෞරුෂ පැතිකඩ පහ (05) ලියා දක්වන්න.

04. "වෙන්වීමේ කාංසාව" (Separation anxiety) කෙරෙහි බලපාන හේතු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ගෙස්ටෝල්ඩ් මනෝ විද්‍යාඥයන් විසින් සංජානන රටා ඇති කිරීම පිළිබඳව ඉදිරිපත් කළ මූලධර්ම තුනක් (03) රූප සටහන් මගින් පැහැදිලි කරන්න.

06. කාල් රොජර්ස්ගේ සිද්ධාන්තයට අනුව ළමයින්ගේ පෞරුෂය තුළ විකෘතීන් ඇතිවන්නේ කෙසේදැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. රෙනේ ඩෙකාට්ස්ගේ (Renee Descartes) 1596 -1650 ප්‍රතික සංකල්පය පැහැදිලි කරන්න.

08. ළමයින් තුළ දක්නට ලැබෙන මනෝ විද්‍යාත්මක අක්‍රමතා පහක් (05) නම් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) අවධානය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ශිෂ්‍ය අවධානය කෙරෙහි බලපාන බාහිර සාධක පහක් **(05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) එම බාහිර සාධක ශිෂ්‍ය අවධානය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) "වෙන්වීමේ කාංසාව" (Separation Anxiety Disorder) පිළිබඳ අක්‍රමතාව සහිත දරුවන්ගේ ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "මුල් ළමාවියෙහි" දරුවන් තුළ වෙන්වීමේ කාංසාව අවම කිරීම සඳහා ගත හැකි උපායමාර්ග දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) දරුවන් තුළ මනෝවිද්‍යාත්මක අක්‍රමතා ඇතිවීමට නිවෙස් පරිසරයේ බලපෑම පිළිබඳව විමර්ශනය කරන්න. (ලකුණු 10)

(ii) දරුවන් තුළ මනෝවිද්‍යාත්මක අක්‍රමතා අවම කිරීම සඳහා දෙමාපියන්ට මැදිහත් විය හැකි ආකාරය උදාහරණ මගින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. (i) පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක දෙකක් **(02)** ලියන්න. (ලකුණු 02)

(ii) සිග්මන් ෆ්‍රොයිඩ්ට අනුව පෞරුෂය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) දරුවන්ගේ පෞරුෂ සංවර්ධනයෙහි ලා ප්‍රාථමික පාසල් ගුරුවරයාගේ භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13. (i) "නිරීක්ෂණාත්මක ඉගෙනුම" යන්න උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු වශයෙන් ඔබ "නිරීක්ෂණාත්මක ඉගෙනුම" ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කරන ආකාරය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.